**Sannasa**
244 Princes Hwy
Hallam Vic 3803 Australia
**Web: www.sannasa.net**
**www.sannasa.com**
email :sannasanews@gmail.com
Tel/Fax :03 9796 4241**after 4pm**

**සංස්කරණය / Editor**
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සංස්කරණ උපදේශක / Editorial Advisor**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සහය සංස්කාරක / Asst. Editor**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**රූ රටා / Graphics**
ශානලී එදිරිසිංහ Shanalee Edirisinghe

**වෙළඳ දැන්වීම් / Advertising**

**S Jayasinghe**
03 8707 4604
0402 025 516

**Anura Kulasekara**
0431 112 923

**email** ads.sannasa@gmail.com

**Account Details for Payments**

**Bank -** ANZ
**Branch -** 013312
**A/C number -** 254306608
**Name of A/C**
Sannasa News Group

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
වි ක ධර්මබන්ධු
ශ්‍රියාණි මද්දුමගේ
මහින්ද දිසානායක දිවුල්ගනේ

**සේයා රූ / Photography**
Prasanna Kurukularatna

**සම්බන්ධීකරණය**

**NSW**
Lakshman Kodituwakku

**QLD**
Ananada Samaratunga
2, Santorini Pl.
Forest Lake
QLD 4078
(07) 3372 7958

**WA**
Ven Beruwala Sobhitha Thero
Sri Lanka Perth Budhdist Vihara

**ACT**
Asoka Nimalasiri
0400 429 031

**SA**
Chandra Eeriyagama
08 8331 2318

පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත




## තවත් අන්තවාදයක් කරා

ශ්‍රී දළදා මාළිගාව අබියස සිට බෞද්ධ භික්ෂුවක ගිනි තබාගෙන සිය දිවි නසා ගැනීම අද සමාජයේ කතාබහට ලක්වන ප්‍රධාන මාතෘකාව වී ඇත. මේ සියදිවි නසාගැනීම අරභයා මතුවන ප්‍රධාන කාරණා රැසකි. බුදු දහමට අනුව සියදිවි නසා ගැනීම බරපතල වරදකි. එසේ තිබියදී භික්ෂුන් වහන්සේ නමක සිය දිවි නසා ගැනීම රටත් ලෝකයත් හමුවේ ප්‍රදර්ශනය කරන්නේ ඉතාමක් වැරදි සහගත ආදර්ශයකි. අනෙක් අතින් රටේ ජනතාවට බලපාන දහසක් ප්‍රශ්න තිබියදී ගව ඝාතනය සම්බන්ධයෙන් මේසා කැපකිරීමක් කරන්නට කිසිවකු කල්පනා කිරීම අදහගත නොහැකි තරම් විස්මයක් දනවන්නකි.

හොඳ නරක පව පින යුක්තිය සාධාරණය මේ ආදී කුමන ආකාරයක ඉල්ලීම් වෙනුවෙන් කරන ඕනෑම සටන් ක්‍රියාමාර්ගයකදි වුවද දිවි පිදීම සිදුවිය යුත්තේ තීරණාත්මක අවසන් පියවරක් ලෙසය. එහෙත් එය කිසියම් ක්‍රියාමාර්ගයක් අරභයා වුවහොත් කුමන සාධාරණ සටනක් වුවද එයින් පසු ඉදිරියට ගමන් ගන්නේ කෙසේද?

පසුගිය කාලය පුරාම ශ්‍රී ලංකාව තුළ දකින්නට අසන්නට ලැබුණු බෞද්ධ භික්ෂුන්ගේ මේ ප්‍රචණ්ඩකාරී අහිංසා විරෝධී හැසිරීම හා ක්‍රියා පිළිවෙත් ගැන අපගේ ගරුතර මහ නායක ස්වාමීන්වහන්සේලාත් ප්‍රකාශ නිකුත් කිරීමෙන් පමණක් සෑහීමකට පත්වී සිටින්නේ කෙසේද යන්නත් මහම ගැටළුවකි.

අනෙක් අතින් සියදිවිහානි කරගැනීමේ ක්‍රමවේද අතරින් ඉතාම බිහිසුණු ක්‍රමයකින් සියදිවි නසා ගැනීමට මේ භික්ෂුව පෙළඹෙන්නේ තමන්ගේ තනි තීරණයකින් නොවන බව පැහැදිළිය. සිය දිවිහානි කර ගැනීම සඳහා ඔහු පොළඹවන යම් බලවේගයක් තිරයෙන් පිටුපස තිබුණ බව මේ මරණයෙන් පසුව දැනගන්නට ලැබුණ තොරතුරු ඉඟිකරයි. එසේ නම් මේ බලවේගය කුමක් ද? අපට සිතෙන ආකාරයට මේ බලවේගය හෝ බලවේග හෝ හඳුනා ගැනීම අද දවසේ ඉතා වැදගත්ය. අපේ රට අන්තවාදය කරා ඇදගෙනගොස් තවත් අවිචියක් කරන්නට සැරසෙන මේ බලවේග හඳුනාගැනීමත් ඒ විනාශය වළක්වා ගැනීමත් රටට ආදරය කරන සියලු පුරවැසියන්ගේ වගකීමක් හා යුතුකමක් වන බව ලියා තබමු.

යම් ව්‍යසනයක් සිදුවූවාට පසු පසුතැවෙනවාට වඩා එවැන්නක් සිදුවීම කල්ඇතිව වළක්වාගැනීම බුද්ධිගෝචරය.

සංස්කාරක

# සන්නස වසර අටක් සපුරයි



## “තමාට සිදුවෙනු දැකීමට නොකැමැති කිසිවක් අනුන්ට නොකරව”
## නිර්ආගමිකත්වය උදෙසා

ශ්‍යාමොන් ජයසිංහ

කෞමාර මෛථුන්‍යයට (කුඩා ළමුන්ව ලිංගික අපහරණයට ලක්කිරීමට) අදාළව ලෝකයේ බොහෝ තැන්වල ප්‍රසිද්ධියට පත් ක්‍රිස්තියානි ධුරාවලියේ හැසිරීම ගැනත්, ශ්‍රී ලංකාවේ බෞද්ධ භික්ෂූන්ගේ වියරු ප්‍රචණ්ඩකාරී හැසිරීම ගැනත් සිතීමේ දී, කලකට පෙර පේරාදෙණි විශ්ව විද්‍යාලයේ දර්ශනවාදය හැදෑරූ සිව් වසර තුළ ආගම ගැන මා තුළ උපන් සංශයවාදය (සැකය) යළි සනාථ කිරීමේ අවශ්‍යතාව නැවතත් හටගෙන තිබේ.

අධ්‍යාත්මික දේවල් ගැන මම උදක්ම විශ්වාස කරමි. විස්තරාත්මකව කිවහොත්, සහසංවේදී වීම හෙවත් අනුන්ගේ දුක මගේ දුකක් කර ගැනීම, අනුන් විපතට පත් විටෙක ඔවුන් සමග මා ද අනන්‍ය වීම වැනි මනුෂ්‍ය භාව ගුණයට ගැනෙන දේවල්■ කරුණාව, දයාව, ආලය පෑම සහ ආලයට ලක්වීම, නිර්මාණාත්මක වීම, කලාකෘතියකට හෝ සාහිත්‍යයට සංවේදී වීම වැනි ආධ්‍යාත්මික භාව ගුණ මම උදක්ම අගය කරමි. අපගේ සදාචාර ප්‍රකෘතිය ජනනය වන්නේ, දයාව, සත්‍යවාදීත්වය සහ සහසංවේදීත්වයෙනි. එය, පැහැදිළිවම ආගමකට මොනම සම්බන්ධයක්වත් ඇති දෙයක් නොවේ. "තමාට සිදුවෙනු දැකීමට නොකැමැති කිසිවක් අනුන්ට නොකරව" යනුවෙන් කොන්ෆියුසියස් කීය. සදාචාරයේ සාමාන්‍ය තර්කනය එයයි.

අනිත් අතට, ආගම් හරහා සදාචාර හැසිරීම භීතිය මත පදනම් කිරීම නිසා අපේ ආධ්‍යාත්මික සහ සදාචාරමය සංවේදය මොට කරනු ලැබේ. නපුරක් කළොත් අවසාන විනිශ්චය දිනයේ දී ඔබව නිරයට කැපවෙනු ඇත. මෙවැනි බියක් නිසා, වැරදි නොකරන පුද්ගලයා යහපත් පුද්ගලයෙකු වන්නේ නැත. යහපත කළ යුත්තේ ස්වයං*අවබෝධයකිනි. ස්වේච්ඡාවෙනි. ජනප්‍රිය බුද්ධාගමේ සහ හින්දු ආගමේ පවා බිය නැමැති සාධකය තිබේ. ලෝවැඩ සගරාව නරකාදිය ගැන කතා කරයි. එය, පව්කාරයන් ගින්නේ පිලිස්සෙන ක්‍රිස්තියානි ආගමේ නිරයට සමාන ය. විදග්ධ බුද්ධාගමේ සහ හින්දු ආගමේ පවා ඉගැන්වෙන නරක ප්‍රතිසන්ධියක් ලැබීමේ ශක්‍යතාව තුළින් ජනිත කෙරෙන අවදානම මගින් ද කෙරෙන්නේ භීතිය හරහා සදාචාර හැසිරීමක් අපේක්ෂා කිරීමයි.

4 වන පිටට